# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2015 මැයි මස 22 වන දින

## II වන කොටස

## අතිරේකය

## (2015. 05. 25 දින නිකුත් කරන ලදී)


### විසිපස්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි.)

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රාජිව විජේසිංහ මහතා විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 18.00 යි. තැපැල් ගාස්තුව : රු. 15.00 යි.

# විසිපස්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත විසිපස්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 සිට 17 දක්වා වූ ව්‍යවස්ථා පරිච්ඡින්න කොට පහත දැක්වෙන වගන්ති ප්‍රතිශෝධනය කරන්න:—

*සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස.*

10. (1) සෑම තැනැත්තකුටම සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස, තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද ඇත්තේ ය :—

(2) මෙම වගන්තිය මගින් ප්‍රකාශයට පත් කරන ලද හා පිළිගත් මූලික අයිතිවාසිකම් භුක්තිවිඳීම සඳහා සීමා පැනවීම කළ නොහැක.

*මානව ගෞරවය සඳහා අයිතිය.*

10අ. (1) සෑම තැනැත්තකුටම උපතින්ම හිමි ගෞරවයක් ඇති අතර එයට ගරු කිරීම හා ආරක්ෂා කිරීම කළ යුතු ය :—

(2) මෙම වගන්තිය මගින් ප්‍රකාශයට පත් කරන ලද හා පිළිගන්නා ලද අයිතිවාසිකම් සඳහා සීමා පැනවීම නොකළ යුතු ය.

*ජීවිතයට උපතින්ම උරුම වූ අයිතිය*

10 ආ.(1) සෑම පුද්ගලයෙක්ටම ජීවිතයට උපතින් උරුම වූ අයිතියක් ඇති අතර තම ජීවිතය අත්තනෝමතිකව අහිමි කළ නොහැක.

(2) කිසිම පුද්ගලයකු මරණ දඬුවමට යටත් නොකළ යුතු ය.

(3) 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වීමට පෙර මරණ දඬුවම නියම කරන ලද සෑම පුද්ගලයෙක් සම්බන්ධයෙන්ම එවැනි දඬුවමක් බරපතල වැඩ සහිත සිරගත කිරීමට පරිවර්තනය වන්නේ ය.

2—PL 009042 -325 (2015/05)

(4) මෙම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශයට පත්කර ඇති හා පිළිගෙන ඇති අයිතිවාසිකම්වලට සීමා පැනවිය නොහැක.

නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පිළිගැනීම.

10ඇ.(1) සෑම තැනැත්තකුමටම නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පිළිගැනීමට අයිතියක් ඇත.

(2) මෙම වගන්තිය මගින් ප්‍රකාශයට පත් කරන ලද හා පිළිගන්නා ලද අයිතිවාසිකම් සඳහා සීමා පැනවීම නොකළ යුතු ය.

වදහිංසාවලට ලක් නොවීමේ නිදහස

11.(1) කිසිම තැනැත්තකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය :—

(2) මෙම වගන්තිය මගින් ප්‍රකාශයට පත් කරණ ලද හා පිළිගන්නා ලද අයිතිවාසිකම් සඳහා සීමා පැනවීම නොකළ යුතු ය.

පුද්ගල ආරක්ෂාව

11.(1) සෑම පුද්ගලයකුටම —

(අ) ශාරීරික හා මානසික නිදහස හා

(ආ) පුද්ගලයකු දන්වන ලද කැමැත්තකින් තොරව කිසිඳු වෛද්‍ය හෝ විද්‍යාත්මක අත්හදා බැලීමකට යොදා නොගත යුතු ය.

යන අයිතිවාසිකම් ඇත.

(2) මෙම වගන්තිය මගින් ප්‍රකාශයට පත් කරන ලද හා පිළිගන්නා ලද අයිතිවාසිකම් සඳහා සීමා පැනවීම නොකළ යුතු ය.

සමානාත්මතාවයේ අයිතිය හා වෙනස් ලෙස සැලකීමෙන් නිදහස් වීම

12. (1) සියලු පුද්ගලයන් නීතිය ඉදිරියේ සමාන වන අතර නීතියේ රැකවරණය ලැබීමට සුදුසුකම් ඇත්තේ ය.

(2)(අ) කිසිම පුරවැසියකු ජනවර්ගය, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගික නැමියාව, මාතෘභාවය, විවාහක අවිවාහක බව, ආගම,ජනවාර්ගික හෝ සමාජික මූලාශ්‍රය, වර්ණය,වයස, අබාධිකභාවය, හෘදය සාක්ෂියේ නිදහස හෝ විශ්වාසය, දේශපාලන හෝ වෙනත් මත, සංස්කෘතිය, භාෂාව, උපන් ස්ථානය සහ පදිංචි ස්ථානය ආදිය ද ඇතුළත්ව කුමන පදනමක් යටතේ හෝ කවර වූ හේතුවක් මත වෙනස්කමකට භාජනය නොවිය යුත්තේ ය.

(ආ) එසේ වුව ද, ඕනෑම ජාතික භාෂාවක්, රජයේ සේවයේ, ඕනෑම රාජ්‍ය සංස්ථාවක, තැනැත්තකුට ජාතික භාෂාවක් පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ඇතිව සිටීම සාධාරණව අවශ්‍ය වන අවස්ථාවක ඒ නියුක්තිය හෝ ධුරය සඳහා සුදුසුකමක් වශයෙන් ජාතික භාෂාවක් පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් සාධාරණ කාලයක් තුළ දී ලබා ගත යුතු යයි එවැනි තැනැත්තකුට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(ඇ) එවැනි යම් සේවා නියුක්තියක හෝ ධුරයක හෝ කිසිදු කර්තව්‍යයක් යම් භාෂාවක් පිළිබඳ දැනීම ඇත්තේ නම් මිස ඉටු කළ නොහැකි වන අවස්ථාවල දී, ඒ සේවා නියුක්තිකයාට හෝ ධුරයට හෝ ඇතුළත් කර ගැනීමේ සුදුසුකමක් වශයෙන් යම් තැනැත්තකුට ඒ භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් තිබිය යුතු යයි නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) මෙම වගන්තියේ, ඉහත 2 පරිච්ඡේදයේ,(අ) උප පරිච්ඡේදයේ විස්තර කරන ලද කුමන ආකාරයේ හෝ හේතු මත, වෙළෙඳසැල්වලට, ආපන ශාලාවලට, හෝටල්වලට පොදු විනෝද ස්ථානවලට හෝ තමාගේ ආගමට

අයත් පොදු පූජනීය ස්ථානවලට ඇතුළුවීම සම්බන්ධයෙන් යම් අශක්නුතාවකට, බැඳීමකට, සීමා කිරීමකට නැතහොත් කොන්දේසියකට කිසිම තැනැත්තෙක් යටත් නොවන්නේ ය.

(4) ජාතිය, ස්ත්‍රී පුරුෂ භාවය, විවාහක අවිවාහක බව, වයස හෝ මානසික හෝ ශාරීරිකව අබාධිත බව ආදිය පදනම් කෙට ගෙන, අනර්ථයට පත් හෝ වරප්‍රසාද නොලත් පුද්ගලයන්ගේ හෝ කාණ්ඩයම්හි ශුභ සිද්ධිය හා ආරක්ෂව සඳහා සඳහා නීතියෙන් හෝ අනුනීතිවලින් හෝ විධායක ක්‍රියා මාර්ගයන් හෝ විශේෂ විධිවිධාන සැලැස්වීම මෙම වගන්තියෙන් කිසිසේත්ම අවහිර නොවන්නේ ය.

(5) ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමට කිසිඳු බාධාවක් නැති මුත් ඒවා භුක්තිවිඳිය හැක්කේත් ක්‍රියාත්මක විය හැක්කේත් රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම පිණිස ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් උදෙසා නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය. එසේම අන් අයගේ නිදහස රැකෙන හා ගෞරව කිරීම අරමුණ කොට මහජන සෞඛ්‍ය හෝ මහජන ආරක්ෂණ නියමයන් මතය.

අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන්. රඳවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස සහ අතීතතයට බලපාන දණ්ඩන නීති පැනවීම තහනම් කිරීම

13. (1) නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනනුකූලව මිස කිසිම තැනැත්තකු සිරභාරයට ගැනීම, සිරගත කිරීම, හෝ භෞතිකව හික්මවීම් නොකළ යුත්තේ ය.

(2) අත් අඩංගුවේ තබා ගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තකුටම මනුෂ්‍යකු සතු මානව ගෞරව සහිතව ගරු කළ යුතු ය.

(3) නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනනුකූලව විනිශ්චයකාරවරයකු විසින් කරනු ලැබූ ආඥාවක් මත මිස ඒ තැනැත්තා තවදුරටත් අත් අඩංගුවෙහි තබා ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ නොකළ යුත්තේ ය.

(4) යම් තැනැත්තකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මත ද ඒ තැනැත්තාට අවබෝධ වන භාෂාවකින් මෙම වගන්තියේ (5) හා (6) වන පුද්ගල අයිතිවාසිකම් යටතේ වූ අයිතිවාසිකම් දැන්විය යුත්තේ ය.

(5) සෑම අත්අඩංගුවට පත් පුද්ගලයකුටම තම කැමැත්ත පරිදි ඥාතින් හෝ හිතවතුන් සමග සන්නිවේදනය කිරීමට අයිතිය ඇති අතර සහ එවන් පුද්ගලයකුට තම ඥාතීන් හෝ හිතවතුන් සමග සන්නිවේදන සැලසිය යුතුය.

(6) අත් අඩංගුවට පත් පුද්ගලයාට නීතිඥවරයකුගේ උපදෙස් ලබා ගැනීමට හෝ කරුනු කියා සිටීමට හිමිකම් ඇත්තේ ය. අත්අඩංගුවට පත් පුද්ගලයාට කාර්යක්ෂම නියෝජනයක් ලබා දීය හැකියාව ලබා දීමට රජය විසින් සියලුම පහසුකම් සලසා දිය යුතු ය.

(7) අත් අඩංගුවට පත් වන කිසිවෙක් රඳවා තබා ගනු ලැබූ හෝ සෑම තැනැත්තකු ම අත්අඩංගුවට ගත් අවස්ථාවේ සිට විනිසුරු වෙත රැගෙන යාමේ කාලය හැර පැය 24ක කාලයක් තුළ නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයා ඉදිරියට ගෙන යා යුතු අතර, නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනකූලව ඒ විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබූ අඥාව මත සහ ආඥාව ප්‍රකාර මිස, ඒ තැනැත්තා තවදුරටත් අත් අඩංගුවෙහි තබා ගැනීම හෝ රඳවා තබා ගැනීම නොකළ යුත්තේ ය.

(8) අත් අඩංගුවට හෝ රඳවා ගැනීමට පත්වන ඕනෑම පුද්ගලයකුට නීතිය මගින් ලබා දී ඇති ඇප මත හෝ බැඳීමකට යටත් ව නිදහස් විය හැක්කේ ය. මෙවන් ඇපයක ප්‍රමාණය හෝ බැඳීමේ ප්‍රමාණය සිද්ධියේ ස්වභාවය මත තීරණය විය යුතු අතර එම ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

(9) තැනැත්තෙක් වරදක් කළ බවට සැක කරන අවස්ථාවක දී සිද්ධියේ සාධක හා ප්‍රමාණය සලකා බලා චෝදනා ගොනු කිරීම, පෙන්වාදීම හෝ නිදහස් කිරීම සාධාරණ ප්‍රමාදයකින් තොරව එම සිද්ධියේ පරියේෂණ සහ කරුණු සලකා බලා සිදු කළ යුත්තේ ය.

(10) වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව චෝදනා නඟනු ලැබ ඇත්තේ ද, ඒ තැනැත්තාට නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයක දී පෞද්ගලිකවම හෝ නීතිඥවරයකු මගින් හෝ කරුණු කියා සිටීමට හිමිකම ඇති අතර විනිසුරු විසින් එසේ දැණුම් දෙනු ලැබේ.

(11) (අ) වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව චෝදනා නඟනු ලැබ ඇත්තේ ද, ඒ තැනැත්තාට—

(i) අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව,
(ii) සුදුසු උසාවියක දී,
(iii) සාධාරණ නඩු විමසුමකින්, හා
(iv) මෙම පරිච්ඡේදයේ උප පරිච්ඡේද (ආ) යටත්ව ප්‍රසිද්ධ නඩු ඇසීමට යොමු වීමට හිමිකම් ඇත්තේ ය.

(ආ) විනිසුරුවරයකුට යම් අවස්ථාවක දී, ලිංගිකත්වය සම්බන්ධ හෝ බාලකයකුගේ අභිමතය හා පර්යාය පිළිබඳ අභිමතයන්,

ජාතික ආරක්ෂාව ප්‍රජාතාන්ත්‍රික සමාජයක ජාතික සාමය ආරක්ෂාව හා උසාවි භූමියේ ආරක්ෂාව සඳහා විනිසුරුවරයාගේ අභිමතය පරිදි නඩුව ඇසීමේ කටයුත්තට අවශ්‍ය නැති පුද්ගලයන් උසාවියේ නඩු ඇසීමෙන් ඉවත් කළ හැක.

(12) (අ) වරදකරු යයි ඔප්පු කරනු ලබන තෙක්ම සෑම තැනැත්තකු ම නිර්දෝෂී යයි පූර්වානුමාන කළ යුත්තේ ය.

(ආ) ඕනෑම නීතියක සඳහන් විශේෂ වූ සිද්ධි ඔප්පු කිරීමේ භාරය චූදිත තැනැත්තකු වෙත එම නීතියෙන් පවරා ලැබිය හැකි ප්‍රමාණය දක්වා, මේ ඡේදයේ (අ) උපඡේද අතුරින් දැක්වෙන අනුකූල නොවේ.

(13)(අ) කිසිම තැනැත්තකු වරදක් පාපොච්චාරණය කර ගැනීම සඳහා ඔහුගේ හෝ ඇයගේ කැමැත්තකින් තොරව පරීක්ෂණයකට භාජනය කිරීමකට බල නොකළ යුතු ය.

(ආ) යම් වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ඒ වරද සම්බන්ධයෙන් බලපැවැත් වූ දණ්ඩනයට වැඩි කිසිම දණ්ඩනයක් ඒ වරද සම්බන්ධයෙන් නියම නොකළ යුත්තේ ය.

(14)(අ) යම් ක්‍රියාවක් හෝ යම් නොකරහැරීමක් සිදුවූ අවස්ථාවේ දී එය ජාතින්ගේ සම්මතයේ පිළිගත් පොදු නෛතික මූලධර්ම අනුව සාපරාධී ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් කිසිම තැනැත්තකු වරදකට වරදකරු විය යුතු හෝ දඬුවම් ලැබිය යුතු නොවේ.

(ආ) යම් වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ඒ වරද සම්බන්ධයෙන් බලපැවැත් වූ දණ්ඩනයට වැඩි කිසිම දණ්ඩනයක් ඒ වරද සම්බන්ධයෙන් නියම නොකළ යුත්තේ ය.

(15) නීතියට අනුව නිසි අධිකරණයක් මගින් වැරදි කරු හෝ නිදහස් කිරීම සිදු කරන ලද ඕනෑම පුද්ගලයකු එම වරදම සම්බන්ධයෙන්, අභියාචනා හෝ ප්‍රතිශෝදන අධිකරණ බලය ක්‍රියාත්මක කරන වෙනත් උසාවියක විභාගයකට යටත් විය නොවිය යුත්තේ ය.

(16)(අ) නිසි අධිකරණයක් හා නීති මගින් ස්ථාපිත ක්‍රියාවලියක අණකින් හැර කිසිවෙකුට සිරගත කිරීම නොකළ යුතු ය.

(ආ) අත්අඩංගුවේ තබා ගැනීම, සිරභාරයට ගැනීම, රඳවා තබා ගැනීම හෝ අන්‍යාකාරයකින් තැනැත්තකුගේ පෞද්ගලික නිදහස-

(i) පසුබිම් වූ වාතාවරණය අනුව අසාධාරණ නොවන්නේ නම්, විසඳීමට තිබෙන පරීක්ෂණ හෝ නඩු විභාග දඬුවමට අඩංගු නොවේ.

(ii) ආගමන විගමන පනතේ ප්‍රතිපාදන හෝ එවැනි නීති හෝ ආදේශක ප්‍රඥප්ති යටතේ කරනු ලබන ඉවත් කිරීමේ නියෝග හෝ පිටවහල් කිරීමේ නියෝග මෙම ඡේදය උල්ලංඝනය වීමක් නොවන්නේ ය.

(17)(අ) මෙම වගන්තියේ (2) ඡේදය, (10) ඡේදය,(11) ඡේදයේ (අ) උප ඡේදයේ (ii) හා (iii) අයිතමයන්, (14) වන ඡේදය, (15) ඡේදය හා (16) ඡේදය යටතේ ප්‍රකාශයට පත් කොට හා පිළිගන්නා ලද අයිතිවාසිකම් මත සීමා පැනවීමක් කළ නොහැක.

(ආ) ප්‍රජාතන්ත්‍රවාදී සමාජය ආරක්ෂා කිරීම හෝ අන් අයගේ නිසි පිළිගැනීම හා අන් අයගේ අයිතිවාසිකම් හා නිදහස සඳහා ගරු කිරීම යන අරමුණ උදෙසා නීතිය මගින් විස්තර වන සීමා කිරීම් පනවන ලද

අවස්ථාවන්හි දී හැර මෙම වගන්තියේ (1), (3), (4), (5), (6), (7), (8), (9) ඡේදයන් හා (11) ඡේදයේ (අ) උප ඡේදයේ (ii) හා (iii) අයිතමයන් හා (12) හා (13) යන ඡේදයන්ගෙන් යටතේ ප්‍රකාශයට පත් කොට හා පිළිගන්නා ලද අයිතිවාසිකම් මත සීමා පැනවීමක් කළ නොහැක.

**මත දැරීමේ නිදහස**

14.(1) සියලු පුද්ගලයන්ට බාධාවකින් තොරව මත දැරීමේ නිදහස තිබිය යුත්තේ ය. :—

(2) මෙම වගන්තියේ (1) වන ඡේදයෙන් ප්‍රකාශයට පත්කොට පිළිගන්නා වූ අයිතිවාසිකම් මත සීමා පැනවිය නොහැක.

**ප්‍රකාශනය හා තොරතුරු සඳහා නිදහස ඇතුළුව භාෂණයේ හා අදහස් පළ කිරීමේ නිදහස**

14.(අ) (1) ප්‍රකාශනය හා තොරතුරු සඳහා නිදහස ඇතුළුව භාෂණයේ හා අදහස් පළ කිරීමේ නිදහස සෑම පුද්ගලයයකුටම හිමි වේ. මෙම අයිතිවාසිකමට, දේශසීමාවන් නොසලකා, වාචිකව, ලිඛිතව, මුද්‍රිතව, කලා මාධ්‍යයක් ලෙස හෝ වෙනත් ඕනෑම මාධ්‍යයක් මත පළ කිරීමේ නිදහස හා බලාපොරොත්තු වීම, තොරතුරු හා අදහස් ලබා ගැනීම හා බෙදාහැරීම අයත් වේ.

(2) ජාතික ආරක්ෂාව, රටේ යථා පැවැත්ම සුරක්ෂිත කිරීම,මහජන සෞඛ්‍ය හා සදාචාරය සුරැකීම, වාර්ගික හා ආගමික සමගිය හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද සම්බන්ධව, උසාවිය අපහාසයට පත් කිරීම, අපහාස කිරීම හෝ අපාරාධයකට පෙළඹවීම, හෝ අන් අයගේ අයිතිවාසිකම් හා නිදහස ගරු කිරීම යන අරමුණු ආරක්ෂා කිරීම යන ප්‍රජාතන්ත්‍රවාදී සමාජය සුරක්ෂිත කිරීමේ අරමුණින් නීතිය මගින් විස්තර වන සීමා කිරීම් පනවන ලද අවස්ථාවන්හිදී හැර මෙම

වගන්තියෙන් ප්‍රකාශයට පත් කොට හා පිළිගන්නා ලද අයිතිවාසිකම් මත සීමා පැනවීමක් කළ නොහැක.

තොරතුරු දැනගැනීමේ අයිතිය

14. (1) සෑම පුද්ගයකුටම තොරතුරු දැනගැනීමට අයිතියක් ඇත.

(අ) පළාත් අධිකාරීන් ද ඇතුළත්ව, රාජ්‍යය ඕනෑම තොරතුරක්.

(ආ) පුද්ගල අයිතිවාසිකම් රැසකට හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන ඕනෑම පුද්ගලයකු දරන ඕනෑම තොරතුරක්.

(2) සෑම පුරවැසියකුටම නියමයන් විසින් කරන ලද සුදුසු නාමික ගාස්තුවක් ගෙවීමෙන්, රජයට සම්බන්ධ කාර්යක් හෝ ප්‍රතිපත්ති හෝ වියදමකට අදාළව හෝ පළාත් හා ප්‍රාදේශීය අධිකාරීන්ට සම්බන්ධ කාර්යක් හෝ ප්‍රතිපත්ති හෝ වියදමකට අදාළ ඕනෑම තොරතුරක් ලබා ගැනීම සඳහා හිමිකම් තිබේ.

(3) මෙම අයිතිවාසිකම් බලපැවැත්වීම සඳහා පාර්ලිමේන්තුව නීතිය මගින් ප්‍රතිපාදන සැපයිය යුතු ය.

(4) ජාතික ආරක්ෂාව, භෞමික අඛණ්ඩතාවය හෝ මහජන ආරක්ෂාව, අක්‍රමිකතා හෝ අපරාධ වැලැක්වීම, මහජන සෞඛ්‍යය හෝ සදාචාරය සුරැකීම, අන්‍යයන්ගේ කීර්තිය හෝ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, පෞද්ගලිකත්වය, රහස්‍ය භාවය සහිත තොරතුරු හෙළිකිරීම වැලැක්වීම හෝ අධිකරණයේ අධිකාරය හා අපක්ෂපාතීභාවය පවත්වා ගෙන යාම ආදී ප්‍රජාතන්ත්‍රවාදය සමාජය ආරක්ෂා කිරීමේ අරමුණින් නීතිය මගින් විස්තර කරන සීමා කිරීම් පනවන ලද අවස්ථාවන්හීදී හැර මෙම වගන්තියේ ප්‍රකාශයට පත් කොට හා පිළිගන්නා ලද අයිතිවාසිකම් මත සීමා පැනවීමක් කළ නොහැක.

**සාමාකාමීව රැස්වීමේ නිදහස**

14.(ඇ) (1) සාමකාමීව රැස්වීමේ නිදහස සඳහා සෑම පුරවැසියෙකුට හිමිකම ඇත. :—

(2) ජාතික ආරක්ෂාව, රටේ යථා පැවැත්ම සුරක්ෂිත කිරීම, වාර්ගික හෝ ආගමික සහජීවනය, මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම, හෝ අන්‍යයන්ගේ නිදහස සඳහා අයිතිවාසිකම් හා ගරු කිරීම යන අරමුණු ආරක්ෂා කිරීමේ අරමුණින්, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා නීතිය මගින් විස්තරවන සීමා කිරීම් පනවන ලද අවස්ථාවන්හි දී හැර මෙම වගන්තියෙන් ප්‍රකාශයට පත් කොට හා පිළිගන්නා ලද අයිතිවාසිකම් මත සීමා පැනවීමක් කළ නොහැක.

**සමාගමයේ නිදහස**

14.(ඈ)(1) සමාගමයේ නිදහසට සෑම පුරවැසියෙකුටම හිමිකම් ඇත.

(2) ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම, රටේ යථා පැවැත්ම, වාර්ගික හෝ ආගමික සහජීවනය, ජාතික ආර්ථිකය, මහජන සෞඛ්‍ය හෝ සදාචාරය සුරැකීම, හෝ අන්‍යයන්ගේ නිදහස අයිතිවාසිකම් සඳහා ගරු කිරීම, යන අරමුණ ආරක්ෂා කිරීමේ අරමුණින්, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා නීතිය මගින් විස්තර වන සීමා කිරීම් පනවන ලද අවස්ථාවන්හි දී හැර මෙම වගන්තියෙන් ප්‍රකාශයට පත් කොට හා පිළිගන්නා ලද අයිතිවාසිකම් මත සීමා පැනවීමක් කළ නොහැක

**වෘත්තිය සමිති අයිතිවාසිකම්**

14.(ඉ)(1) පුද්ගල කැමැත්ත මත, වෘත්තීය සමිති පිහිටුවීම සහ වෘත්තීය සමිතිවලට බැඳීමේ නිදහසට හා එවන් වෘත්තීය සමිති අනිසි බාධාවන්ගෙන් තොරව පවත්වාගෙන යාමට සෑම පුරවැසියකුටම හිමිකම් ඇත.

(2) නීතිමය අනුකූලව ලබා දී ඇති අයිතිවාසිකම් මත වැඩ වර්ජනයද ඇතුළත්ව, වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයන්ට සහභාගී වීමට සෑම පුරවැසියකුටම හිමිකම් ඇත.

(3) ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම, රටේ යථා පැවැත්ම, වාර්ගික හෝ ආගමික සහජීවනය හෝ අන්‍යයන්ගේ නිදහස හා අයිතිවාසිකම් සඳහා අදාළ ගරු කිරීම ආරක්ෂා කිරීමේ අරමුණින්, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා නීතිය මගින් විස්තරවන සීමා කිරීම් පනවන ලද අවස්ථාවන්හිදී හැර මෙම වගන්තියෙන් ප්‍රකාශයට පත් කොට හා පිළිගන්නා ලද අයිතිවාසිකම් මත සීමා පැනවීමක් කළ නොහැක.

**ආගම් ප්‍රකාශ කිරීමේ නිදහස**

14ඊ (1) තනිව හෝ අන් අය හා සමඟ සහ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව පුද්ගලයකුගේ ආගම් ප්‍රකාශ කිරීම හෝ විශ්වාසයෙන් ඇදහීම, පිළිපැදීම, ප්‍රගුණ කිරීම, ප්‍රචාරණය සහ ඉගැන්වීමට සෑම පුරවැසියකුටම හිමිකම් ඇත.

(2) මෙම වගන්තියේ (1) වැනි ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී, අන් පුද්ගලයකුට හානියක් කිරීමට හෝ නොඑසේ නම් අන් කෙනෙකුට තමන්ගේ කැමැත්ත මත ආගමක් වැළඳ ගැනීමට හෝ විශ්වාස කිරීමට තිබෙන නිදහසට අවහිර කිරීමට කිසිම පුද්ගලයකුට අයිතියක් නැත.

(3) ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම, රටේ යථා පැවැත්ම, මෙම වගන්තියේ (2) ඡේදය මගින් ප්‍රකාශයට පත් කොට තිබෙන නිදහස ද, ඇතුළත්ව, අන්‍යයන්ගේ නිදහස හා අයිතිවාසිකම් සඳහා අදාළ ගරු කිරීම ආරක්ෂා කිරීමේ අරමුණින්, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා නීතිය මගින් විස්තර

වන සීමා කිරීම් පනවන ලද අවස්ථාවන් හිදී හැර මෙම වගන්තියේ (1) ඡේදය මගින් ප්‍රකාශයට පත් කොට හා පිළිගන්නා ලද අයිතිවාසිකම් මත සීමා පැනවීමක් කළ නොහැක.

සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩි දියුණු කිරීමේ හා ස්වකීය භාෂාව භාවිත කිරීමේ අයිතිය

14(උ)(1) තනිව හෝ අන් අය සමඟ හෝ සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩි දියුණු කිරීමේ නිදහස සහ ස්වකීය භාෂාව භාවිත කිරීමේ නිදහසට සැම පුද්ගලයකුටම හිමිකම් ඇත.

(2) සංස්කෘතියකට හෝ භාෂාමය ප්‍රජාවකට අයත් පුද්ගලයන් එම ප්‍රජාවේ අනිකුත් සාමාජිකයන්ට එම පුද්ගලයන්ට තමන්ගේ සංස්කෘතිය භුක්ති විඳීමට හා ඔවුන්ගේ භාෂාව භාවිතා කිරීම අහිමි කිරීම සිදු නොවිය යුතු ය.

(3) රටේ යථා පැවැත්ම සුරක්ෂිත කිරීම, වාර්ගික හා ආගමික සහයෝගීතාවය, මහජන සෞඛ්‍ය හෝ සදාචාරය සුරැකීම, පරිසරය සංරක්ෂණය කිරීම හෝ අන්‍යයන්ගේ නිදහස සඳහා අයිතිවාසිකම් සඳහා ගරු කිරීම යන අරමුණ ආරක්ෂා කිරීමේ අරමුණින්, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා නීතිය මගින් විස්තර වන සීමා කිරීම පනවන ලද අවස්ථාවන්හිදී හැර මෙම වගන්තියෙන් ප්‍රකාශයට පත් කොට හා පිළිගන්නා ලද අයිතිවාසිකම් මත සීමා පැනවීමක් කළ නොහැක.

ඕනෑම නීත්‍යානුකූල වෙළඳාමක, රැකියාවක, වෘත්තියක, ව්‍යාපාරයක හෝ කර්මාන්තයක නියුක්ත වීමේ නිදහස

14(ඌ) (1) ඕනෑම නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, වෙළඳමක, ව්‍යාපාරයක හෝ ව්‍යවසායක තනිවම හෝ සාමූහිකව නියුක්ත වීමට නිදහස සැම පුද්ගලයකුටම හිමිකම් ඇත්තේ ය.

(2) ජාතික ආර්ථිකය සුරක්ෂිත කිරීම, ජාතික ආරක්ෂාව, රටේ යථා පැවැත්ම, මහජන සෞඛ්‍ය හෝ සදාචාරය සුරැකීම, පරිසර

සංරක්ෂණය හෝ අන්‍යන්ගේ නිදහස හා අයිතිවාසිකම් සඳහා අදාළ ගරු කිරීම ආරක්ෂා කිරීමේ අරමුණින්, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා නීතිය මගින් විස්තරවන සීමා කිරීම් පනවන ලද අවස්ථාවන්හිදී හැර මෙම වගන්තිය මගින් ප්‍රකාශයට පත් කොට හා පිළිගන්නා ලද අයිතිවාසිකම් මත සීමා පැනවීමක් කළ නොහැක.

(අ) වෘත්තීය, තාක්ෂණවේදී, ශාස්ත්‍රවේදී, මූල්‍ය හා අනෙක් සුදුසුකම් සඳහා ඕනෑම වෘත්තියක් සඳහා පුහුණුවන හෝ මොනම හෝ රැකියාවක නියුතු, වෙළඳ ව්‍යාපාර හෝ ව්‍යවසාය හා බලපත්‍ර ලබා දීම හා විනය පාලනය, වෘත්තියක් හෝ රැකියාවක නියුක්තවීම, වෙළඳාම්, ව්‍යාපාර හෝ ව්‍යවසා ප්‍රගුණ කරණ පුද්ගලයෙක් මෙවන් මූලික අයිතිවාසිකම් පරිහරණය කරයි නම්,

(ආ) රජය විසින් හෝ රාජ්‍ය නියෝජිත ආයතනයක් විසින් හෝ සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමක් විසින් හෝ රාජ්‍ය සංස්ථාවක විසින් හෝ යම් කර්මාන්තයක්, වෙළඳ ව්‍යාපාරයක්, කාර්මික ව්‍යාපාරයක්, සේවාවක් හෝ ව්‍යවසායක් පුරවැසි සහභාගිත්වය නොමැතිව හෝ පුරවැසි කොටසක සහභාගිත්වය ඇතිව හෝ අන්‍යාකාරයකින් හෝ පවත්වාගෙන යාම සම්බන්ධයෙන්.

ව්‍යාපාර නිදහස

14(එ) (1) ජනරජය තුළ ව්‍යාපාරයේ නිදහස සහ වෙනත් පුද්ගලයකුගේ ජනරජය තුළ පදිංචිය ජනරජය තුළ නිත්‍යානුකූලව පදිංචිව සිටින ඕනෑම පුද්ගලයකුට හිමිකම තිබේ.

(2) ඕනෑම පුද්ගලයකුට ජනරජය හැරයාම සඳහා නිදහස තිබේ.

(3) ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම හෝ රටේ යථා පැවැත්ම හෝ ජාතික ආර්ථිකය හෝ මහජන සෞඛ්‍ය හෝ සදාචාරය සුරැකීම හෝ අන්‍යන්ගේ නිදහස හා අයිතිවාසිකම් සඳහා අදාළ ගරු කිරීම හෝ ජනරජයෙන් පුද්ගලයන් උදර්පනය කිරීම ආරක්ෂා කිරීමේ අරමුණින්, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා නීතිය මගින් විස්තරවන සීමා කිරීම පනවන ලද අවස්ථාවන්හි දී හැර මෙම වගන්තිය මගින් ප්‍රකාශයට පත් කොට හා පිළිගන්නා ලද අයිතිවාසිකම් මත සීමා පැනවීමක් කළ නොහැක.

ශ්‍රී ලංකාවට පැමිණීමේ නිදහස

14(ඒ)(1) සෑම පුරවැසියකුටම ජනරජයට පෙරළා පැමිණීමට හිමිකම තිබේ.

(2) මෙම වගන්තිය මගින් ප්‍රකාශයට පත් කොට හා පිළිගන්නා ලද අයිතිවාසිකම් භුක්ති විඳීමට සීමා පැනවීම් කළ නොහැක.

පෞද්ගලිකත්වය හා පවුල් ජීවිත අයිතිය

14(ඔ)(1) පවුල් ජීවිතය සම්බන්ධව අත්තනෝමතික මැදිහත් වීම් වලින් ආරක්ෂා වීමට, නිවසේ දී පීඩා නොවිඳීමට, හුවමාරු කර ගැනීමට හා සන්නිවේදනයට සහ මෙවන් පුද්ගලයකුගේ ගෞරවය හා පිළිගැනීම මත නිත්‍යානුකූල නොවන පහරදීම්වලට ලක් නොවීමට සෑම පුද්ගලයකුටම පෞද්ගලිකත්වය සඳහා අයිතිය තිබේ.

(2) ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම, රටේ යථා පැවැත්ම හෝ ජාතික ආර්ථිකය හෝ මහජන සෞඛ්‍ය හෝ සදාචාරය සුරැකීම හෝ අන්‍යන්ගේ නිදහස හා අයිතිවාසිකම් සඳහා අදාළ ගරු කිරීම නඩු තීරණයක් හෝ නිසි අධිකරණයක නියෝගයක් බලගැන්වීම ආරක්ෂා කිරීමේ අරමුණින් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා නීතිය මගින් විස්තරවන සීමා කිරීම් පනවන ලද අවස්ථාවන්හිදී හැර මෙම වගන්තිය මගින් ප්‍රකාශයට පත් කොට හා පිළිගන්නා ලද අයිතිවාසිකම් මත සීමා පැනවීමක් කළ නොහැක.

**දේපල අයිතිය සඳහා අයිතිවාසිකම**

14(ඔ)(1)ප්‍රජාවේ අයිතිවාසිකම් හා පරිසර සංරක්ෂණය හා ආරක්ෂණය යන ඒවාට විෂය වෙමින් තනිව හෝ අන් අය සමග සමූහයක් වශයෙන් දේපල අයිතිය සඳහා සෑම පුරවැසියකුටම හිමිකම් ඇත්තේ ය.

(2) නීතිය මගින් අනුදත් විටක මිස දේපළ අහිමි කිරීමකට කිසිවෙක් යටත් නොවේ.

(3) නීති අධිකාරිය මගින් දේපල අත් කර ගන්නා පොදු අරමුණ හෝ පොදු උපයෝගිතාවය හෝ රජයේ නියෝගය පැහැදිලිව විස්තර කොට, එකී අවස්ථාවේ දී වෙළඳ පොළේ පවතින අගය අනුව සාධාරණ වන්දි ලබා දීමක් මගින් ග්‍රහණය කර ගැනීමක දී හැර කිසිම දේපළක් අනිවාර්යයෙන් අත්පත් කර ගැනීම සිදු නොකළ යුතු ය.

**පවුල් අයිතිවාසිකම්**

14(ක)(1)පවුල සමාජයේ මූලික කණ්ඩායම් ඒකකය වන අතර, සමාජයෙන් හා රජයෙන් ආරක්ෂාවීමට අයිතියක් ඇත.

(2) විවාහවන වයසේ පසුවන ඕනෑම පුරුෂයකුට හෝ කාන්තාවකට විවාහ වීමට හා පවුලකට පදනම දැමීමට හිමිකම ඇති අතර, පවුල තුළ පුරුෂයා හා කාන්තාවගේ අයිතිවාසිකම් සමාන විය යුතු ය.

(3) විවාහ වීමට අදහස් කරන ස්ත්‍රිය හා පුරුෂයාගේ නිදහස හා පූර්ණ කැමැත්ත නැතිව විවාහයට ඇතුළත් විය නොහැක.

(4) විවාහය තිබෙන කාල පරිච්ඡේදයේ දී හා එය විසිරී ගිය අවස්ථාවන්හිදී, ස්වාමිපුරුෂයා හා භාර්‍යාව ලෙස විවාහයට තිබෙන වගකීම් හා සමානාත්මතාවයේ අයිතිය සහතික කිරීමට රජය නිසි පියවර ගත යුතු ය. එහි දී, දරුවන් සිටී නම් අවශ්‍ය ආරක්ෂාව සැලසීමට ප්‍රතිපාදන සැපයිය යුතු ය.

ළමා අයිතිවාසිකම්

14(ග) (1) සෑම ළමයකුටම,

(අ) ඔහුගේ හෝ ඇයගේ උපත ලියා පදිංචි කිරීමට සහ ඔහුගේ හෝ ඇයගේ උපන් දිනයේ නමක් ගැනීමට අයිතියක් තිබේ,

(ආ) ජාතියක් අත්පත්කර ගැනීමට අයිතියක් තිබේ,

(ඇ) හිංසාවට, අත්හැර දැමීමට, අපයෝජනයට හෝ නින්දාවට ලක්වීමෙන් ආරක්ෂා වීමට අයිතියක් තිබේ,

(ඈ) පවුල් පසුබිම තුළින් ඉවත් කළ විට, පවුලේ රැකබලා ගැනීමට හෝ දෙමාපිය රැකවරණයට හෝ නිසි විකල්ප රැකබලා ගැනීමකට අයිතියක් තිබේ,

(ඉ) මූලික පෝෂණය, වාසස්ථානයක්, මූලික සෞඛ්‍ය රැකබලා ගැනීමේ සේවා හා සමාජ සේවා සඳහා අයිතියක් තිබේ.

(ඊ) ළමයාට බලපාන අපරාධ නඩු විභාගයකදී, රජය මගින් හෝ රජයේ වියදමින් නීති සහය ලබාගැනීමට අයිතියක් තිබේ. එසේ නොවුවහොත් සැලකිය යුතු මට්ටමේ අසාධාරණයක් සිදු විය හැක.

(උ) අවසාන පියවර ලෙස තිබෙන අවස්ථාවක දී හැර රඳවා ගැනීම නොකළ යුතු ය. එවන් රැඳවීමක දී ළමයා හැකි කෙටිම කාල සීමාවක් තුළ රඳවා තබා ගැනීම හා

(i) රඳවා සිටින වයස අවුරුදු 18 ට වැඩි පුද්ගලයන්ගෙන් වෙන් කොට තැබීම.

(ii) ළමයාට සංග්‍රහ සැලකීමේ ක්‍රමය හා රඳවා තැබීමේ වාතාවරණය ළමයාගේ වයස සැළකිල්ලට ගෙන සිදු කළ යුතු ය.

(ඌ) සන්නද්ධ ගැටුමකට භාවිතා නොකළ යුතු අතර සන්නද්ධ අරගල තිබෙන කාලවලදී ආරක්ෂා කළ යුතු ය.

(2) ළමයාගේ හෝ ඔහුගේ හෝ ඇයගේ දෙමාපියන්ගේ හෝ නීත්‍යානුකූල භාරකරුවන්ගේ ජාතිය, වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගික නැම්යාව, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මත, ජාතිය, ජන වර්ගය හෝ සමාජීය සම්භවය, දේපළ, අබාධිතබව, උපත හෝ දෙමාපියන්ගේ විවාහක තත්ත්වය ඇතුළුව වෙනත් පසුබිම් යටතේ දරුවකුට වෙනස් ලෙස නොසැලකිය යුතු ය.

(3) ළමයාගේ සෞඛ්‍යට හානි කරන ඇබ්බැහි ද්‍රව්‍යන් භාවිතයන්හි අනර්ථකාරී ප්‍රතිඵලවලින් ආරක්ෂා වූ පරිසරයක ඇතිදැඩි වීමට සෑම දරුවකුටම අයිතියක් ඇත්තේ ය.

(4) සෑම දරුවකුටම රජය විසින් නොමිලයේ සපයන ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනය ලබා ගැනීමට අයිතිය ඇත්තේ ය. එසේම, සෑම දරුවකුටම නිසි ආකාරයට, විනිවිද භාවය සහිත තෝරා ගැනීමේ ක්‍රියාවලියක් පදනම් කොට ගෙන කුසලතාව හා සමාජීය සාධාරණත්වය මත රජය විසින් නොමිලයේ සපයන උසස් අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනයට අයිතියක් ඇත්තේ ය.

(5) ළමයකු කුමන හෝ අනතුරු දායක ක්‍රියාකාරකමක සේවා නියුක්ත නොකළ යුතු ය. සූරා කෑමට භාජනය වන ශ්‍රම ක්‍රියාකාරකම් වලින් ආරක්ෂා කළ යුතු ය.

(අ) ළමයාගේ වයසට නුසුදුසු පුද්ගලයෙක් සිටින ස්ථානයක

(ආ) ළමයාගේ සුභසාධනය, අධ්‍යාපනය, ශාරීරික හා මානසික සෞඛ්‍ය හෝ අධ්‍යාත්මික සදාචාරයට හෝ සමාජසංවර්ධනය අවධානමට ලක්වන ස්ථාන වල වැඩ හෝ ක්‍රියාකාරකම්වලට සහභාගි වීමට අවසර නොදිය යුතු ය.

(6) මෙම වගන්තිය මගින් පිළිගන්නා ලද අයිතිවාසිකම්, ළමා පුරවැසියකු ලෙස ඇති වෙනත් ඕනෑම හිමිකමකට අමතර මිස ඒවායේ අගය හීන කිරීමට නොවන්නේ ය.

(7) මෙම වගන්තියේ කාර්ය සඳහා "ළමයා" යන්නෙන් වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙක් අයත් වේ.

(8) ළමයා සම්බන්ධ ඕනෑම කරුණක් සලකා බැලීමේ දී, එය භාරගෙන ඇත්තේ රජයේ හෝ මහජන හෝ පුද්ගලික සමාජ ශුභ සාධන ආයතනයක් වුව ද, පරම වැදගත් කරුණ වන්නේ ළමයාගේ උපරිම යහපත වේ.

**අධ්‍යාපන අයිතිය**

14(ච)( 1)සෑම පුද්ගලයකුටම, අධ්‍යාපනයක් ලබා ගැනීමට අයිතිවාසිකමක් තිබේ. එම අධ්‍යාපනය, අන් අයගේ අවශ්‍යතා පිළිබඳ සංවේදී, තාර්කික කල්පනා කුසලතා වැඩිදියුණු කරන, මානව පෞරුෂවර්ධනය එමගින් ඒකාග්‍ර වූ හැගීමක් කරා යොමු කරන හා මානව හිමිකම් සඳහා හා මූලික නිදහස ගරු කිරීම ශක්තිමත් කරුණු ලබන ඒකකයකි. ඊට, සමාජීය කුසලතා සහ මූලාරම්භයන් සඳහා මූලිකත්වය ගන්නා හා නවෝත්පාදනය සංවර්ධනය කිරීමට දායක වන විෂය බාහිර ක්‍රියාකාරකම් හා විනෝදවීම් කටයුතු ඇතුළත් කරනු ඇත.

(2) ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්යවන අතර, සියල්ලන්ටම එය ලබා ගත හැක්කක් විය යුතු ය.

(3) ද්විතීක අධ්‍යාපනය එහි වෙනස් මුහුණුවරක් ගෙන තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය ඇතුළුව ද්විතීක අධ්‍යාපනය රජය මගින් ලබා දෙනු ලබන නිදහස් අධ්‍යාපනය ඇතුළුව ඉතා සුදුසු ආකාරයෙන් පොදුවේ සියල්ලන්ටම ලබා ගැනීමට හැකි ලෙස සකස් කිරීම.

(4) උසස් අධ්‍යාපනය සිසුන්ගේ ධාරිතාවය හා සාධාරණ අවස්ථා පදනම් කොට සියලු සුදුසු ආකාරයෙන් රජය විසින් ලබා දෙන නිදහස් අධ්‍යාපනය සමග ලබා දීමට කටයුතු කළ යුතු ය.

(5) ප්‍රාථමික අධ්‍යාපනය ලබා නැති පුද්ගලයන් සඳහා හා සම්පූර්ණ ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කළ අය සඳහාත් මූලික අධ්‍යාපනය දිරිමත් කිරීම හා තීව්‍ර කිරීම කළ යුතු ය.

(6) ළමයා වෙනුවෙන් ක්‍රියාත්මකවන ළමයාගේ නීත්‍යානුකූල භාරකරු හෝ ඕනෑම වැඩිහිටියකු, පුද්ගලික ආයතයක් විසින් හෝ යම් නිකායකට අයත් හෝ අධ්‍යාපනය තෝරා ගැනීමට මෙම වගන්තියේ තිබෙන කිසිවක් බැහැර නොකළ යුතු ය.

සුරාකෑමෙන් නිදහස්වීම

14(ජ)(1) කිසිම තැනැත්තකු ජාවාරමට වහල් භාවයට හා බලයෙන් ශ්‍රමය ලබා ගැනීමට විෂය නොවිය යුත්තේ ය.

(2) මෙම වගන්තියේ (1) ඡේදයේ දක්වා ඇති කාර්ය සාධනය අනුව උසාවියක් මගින් නිසි විනිශ්චයකින් හෝ සාමාන්‍ය ප්‍රජා වගකීමකින් යුත් සුදුසු අධිකරණයකින් ඕනෑම වැඩ හෝ දඬුවම් දීම ඇතුළත් නොකළ යුතු ය.

කම්කරු අයිතිවාසිකම්

14(ට) (1) විශේෂයෙන්ම, වැඩ කිරීමේ දී සාධාරණ හා හිතකර තත්ත්වයන් භුක්ති විඳීම සහතික කරුණු ලබන තත්ත්වයක් යටතේ වැඩ කිරීමට සෑම පුරවැසියකුටම අයිතිය තිබේ.

(අ) කිසිදු ආකාරයක වෙනසක් නැතිව සමාන කාර්යන් සඳහා සමාන වැටුප් ලැබීම.

විශේෂයෙන්ම, කාන්තාවන්ට පිරිමින් භුක්ති විඳිනවාට වඩා පහත් නොවන කාර්ය කොන්දේසි සහතික කිරීම.

(ආ) ආරක්ෂාකාරී හා සෞඛ්‍ය සම්පන්න වැඩ පසුබිම.

(ඇ) සෑම දෙනාටම රැකියාවේ අදාළ ඉහළ මට්ටමට ලඟා වීම සඳහා උසස්වීම් ලබා ගැනීමේ දී අදාළ නම් ජ්‍යෙෂ්ඨත්වය හා පළපුරුද්ද ඇතුළුව ප්‍රවීනත්වය හා අදාළ සුදුසුකම් මත මිස වෙනත් සලකා බැලීම් විෂය නොවීම.

(ඈ) විවේකය, විනෝදය හා වැඩකරණ පැය ගණන සාධාරණ සීමාවක තිබීම හා කලින් කලට ගෙවීම් සමග නිවාඩු ලබා දීම.

සෞඛ්‍ය සඳහා අයිතිය

14(ඩ)(1)ලඟා කර ගත හැකි උපරිම උසස් තත්ත්වයේ ශාරීරික හා මානසික සෞඛ්‍ය හා රජය මඟින් අවශ්‍ය එම සේවා අවශ්‍ය පුද්ගලයන්ට නොමිලේ සපයන සේවාද ඇතුළත්ව, රෝග නිවාරණය හා සුව සෞඛ්‍ය සත්කාරක සේවා ලබා ගැනීම සඳහා සියලු පුරවැසියන්ට අයිතිය තිබේ.

(2) කිසිම පුද්ගලයකුට හදිසි වෛද්‍ය ප්‍රතිකාර අහිමි නොකළ යුතු ය.

සමාජීය අයිතීන්

14(ණ)(1) සෑම පුරවැසියෙක්ටම පහත දැක්වෙන අයිතියට ප්‍රවේශය තිබේ.

(2) ප්‍රමාණවත් ආහාර සහ ජලය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.